11 ශ්‍රේණිය

ඉතිහාසය

1 .2 ඒකකය

කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය

# කියවීම් පත්‍රිකාව





## කාර්මික විප්ලවය

# කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය

## කාර්මික විප්ලවයට සමගාමීව කෘෂි ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇති වීමට බලපෑ හේතු

- මහා පරිමාණ ගොවිබිම් ආරම්භ වීම

  කාර්මීකරණයත් සමඟ විශාල ලෙස කර්මාන්තශාලා ආරම්භ වීම හේතුකොටගෙන ජනතාව විශාල වශයෙන් නගර කරා ඇදී ඒම නිසා ඔවුන්ගේ ඉඩකඩම් වල වගා කිරීමට නොහැකි විය . එමෙන්ම ගම්බද ඉතිරිව සිටි සුළු පරිමාණ ඉඩම් හිමියනුත් විවිධ හේතු මත තම ගොවි බිම් අතහැර දමන තත්ත්වයක් උදාවිය. මේ අනුව අතහැර දැමූ එමෙන්ම ගොවීන්ගෙන් පවරා ගත් කුඩා ප්‍රමාණයේ ගොවිබිම විශාල ප්‍රමාණයක් එක් කරමින් මහා පරිමාණ ගොවිබිම් ආරම්භ කෙරිණි . ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරයට අයත් වූ මෙම ඉඩම් වල මහා පරිමාණයෙන් වගා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික දියුණුවක් ඇති විය.

- ශෂ්‍ය මාරු ක්‍රමය

  වගා කටයුතු සඳහා ශෂ්‍ය මාරු ක්‍රමය හඳුන්වාදීම ලෙඩ රෝග ව්‍යාප්තිය අවම කිරීමටත් ඵලදායිතාව වැඩි කිරීමටත් හේතු විය .

- සත්ව පාලන කටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගැනීම

  සත්ව පාලන කටයුතු සඳහා තාක්ෂණය යොදා ගැනීම නිසා නිෂ්පාදන ඉහළ ගියේය.
  උදා : රොබට් බැක්වෙල් විසින් බැටලු වර්ග අභිජනනය ආශ්‍රිත සොයාගැනීම්

- නව කෘෂිකාර්මික ක්‍රම හා උපකරණ භාවිතය

  කාර්මික විප්ලවයත් සමඟ වඩාත් කාර්‍යක්ෂම උපකරණ බිහිවීමත් සමග කැලෑ එළි පෙහෙළි කිරීමට, බිම් සැකසීමට, බීජ වර්ග නිෂ්පාදනයට යන්ත්‍රසූත්‍ර නිපදවනු ලැබීය. එමෙන්ම කෘෂි ක්ෂේත්‍රයෙහි වැඩි ඵලදාවක් ලබාගැනීම සඳහා පොහොර වර්ග නිපදවීම කෙරෙහි අවධානය යොමු කිරීම නිසා එහි ප්‍රතිඵලයක්

ලෙස දකුණු අප්‍රිකාවේ ගුවානෝ් නම් පොහොර විශේෂයක් නිපදවන ලදී .
පසුකාලයේදී රසායනික පොහොර කෘෂිරසායන නිෂ්පාදන ද සිදු කෙරිණි .